PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

17.12.2021

ප්‍රවෘත්ති කතෘ / සංස්කාරක

**කොවිඩ් 19 න් වැසී යන පළාත් පාලන මැතිවරණය**

විෂය භාර අමාත්‍යවරයාට ඇති බලතල අනුව මේ වන විට පළාත් පාලන මැතිවරණය වසරකින් කල් දැමීමට කැබිනට් මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කර තිබේ. කල් දැමීමට හේතුව කොවිඩ් 19 වසංගතය බව අමාත්‍යවරයා මාධ්‍යයට ප්‍රකාශ කරනු දක්නට ලැබුණි. එහෙත් එය හුදෙක් කොවිඩ් වසංගතය හේතුවෙන් නොවන බව ඕනෑම පුරවැසියෙකුට තේරුම් යන සරල කරුණකි. කොවිඩ් රැල්ලේ ආරම්භක අදියරේදී රට පුරා පාර්ලිමේන්තු මැතිවරණය සාර්ථකව පවත්වන්නට මැතිවරණ කොමිෂන් සභාව සමත් විය. එමෙන්ම ඒ මොහොතේ විපක්ෂය වූ වර්තමාන ආණ්ඩු පක්ෂය මැතිවරණ පැවැත්වීමට නිරන්තර අරගලයක යෙදුනි. ඒ මොහොතේ පැෆ්රල් සංවිධානයද ඒ වෙනුවෙන් එම පිරිස සමග පෙනී සිටියෙමු. මේ මොහොතේ මැතිවරණයක් පවත්වනවාද යන ප්‍රශ්නයේදී මහජන අවධානය යොමුවන ප්‍රධාන කරුණු කිහිපයක් දැකිය හැකිය.

1.මැතිවරණය පැවැත්වීම හරහා කොවිඩ් අවධානම වැඩිවිය හැකිද?

2.මැතිවරණයකට වැයවිය හැකි (මැතිවරණ කොමිසමට වැයවන) මිලියන 6,000 - 10,000 පමණ වන මුදල මේ මොහොතේ රටට දරා ගත හැකිද?

3.ඉදිරි මැතිවරණයට පෙර නව ක්‍රමය සමග දෙගුණයක් වූ සභික ප්‍රමාණය අඩුකිරීමට කටයුතු කරනු ලබන්නේද?

4.විශාල මුදලක් වැයකර පත්කරගන්නා මහජන නියෝජිතයින් පිළිබද ජනතාවට විශ්වාසයක් තිබේද, ඔවුන් පත්කිරීම හරහා ජනතාවගේ ජීවන මට්ටමෙහි වෙනසක් ඇතිවිය හැකිද?

ඉහත කරුණු දැනුවත් පුරවැසියෙකුගේ අවධානය යොමුවන කරුණු වුවද මේ මොහොතේ මැතිවරණය කල්දමනු ලබන්නේ දේශපාලන කරුණු මත බව බැලූ බැල්මට පෙනී යන කරුණකි. මේ පිළිබදව උදාහරණ ඕනෑ තරම් යහපාලන රජය සමයේත් ඊට පෙරත් දැකිය හැකිය. ලංකාවේ මැතිවරණ සිතියම ඒ මොහොතේ බලයේ සිටින පාලකයා තමාට අභිමත පරිදි හැසිරවීම නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයට කෙරෙන මරු පහරකි. ඡන්දදායකයාට කරන නිගරුවකි. සර්වජන ඡන්ද බලයට වසර 90 පිරෙන මෙම වර්ෂයේ ඡන්දදායකයාට, පුරවැසියාට තිබූ අයිතිය පැහැරගැනීමකි. එමෙන්ම ආණ්ඩුව ක්‍රියාත්මක කරන ප්‍රතිපත්ති පිළිබද ජනතා මතය උරගා බැලීමට සහ අවශ්‍ය වන්නේ නම් එම ප්‍රතිපත්ති වෙනස් කර ගැනීමට ආණ්ඩුවට ඇති නීත්‍යානුකූල අවස්ථාව මගහැර ගැනීමකි.


#No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06.

Tel : (+94) 11 2558570 / 11 2558571 Fax : (+94) 11 2558572

Email : paffrel@sltnet.lk Web : www.paffrel.com

පසුගිය දශක හතරක කාලසීමාව දෙස ආපසු හැරී බැලීමේදී පාලන බලය හෙබවූවන්, මැතිවරණ සිතියම හකුලමින් ජනතා පරමාධිපත්‍ය බලය උරගා බලන්නට අවස්ථාව නොදීම තුළ ඇති වූ කලකිරීම් සහ පීඩනයන් කෙලවර වූයේ අවාසනාවන්ත සිදුවීම් සමුදායකිනි. එහි අනිටු පලවිපාක වර්තමානයේද අප අත්විඳිමින් සිටිමු. මෙම අවාසනාවන්ත තත්ත්වයට පාලන බලය හෙබවූ සියළු පාර්ශවයන් අඩුවැඩි වශයෙන් වගකිය යුතු බව අප විශ්වාස කරමු.

කුමන තත්ත්වයක් යටතේ වුවද පුරවැසියන්ට වරින් වර තම පාලකයන් තෝරා ගැනීමට හා තම මතය ප්‍රකාශ කිරීමට ඇති අනුලංඝනීය අයිතිය සුරක්ෂිත කල යුතු බව විශ්වාස කරන අප එකී අවස්ථාව අහිමි කරනු ලැබුව හොත් එය වෙනත් ආකාරයකින් මතුවීමේ අවධානමක් ඇති බවද අවධාරණය කරනු කැමැත්තෙමු.



රෝහණ හෙට්ටිආරච්චි

විධායක අධ්‍යක්ෂ

'

17th December 2021

News Editor / Editor
Press release

**Local Government Election being eclipse d by Covid 19**

The Minister in charge of Public Services, Provincial Councils & Local Governmentusing the powers vested in him has submitteda proposal to the Cabinet of Ministers to postpone the local government elections by one year. The Minister has informed the media that the postponementwas due to the prevailing Covid 19 pandemic situation. But it is not difficult for any citizen to comprehend that it has been postponednot because of the Covid pandemic. In the early stages of the Covid wave, the Election Commission was able to hold parliamentary elections across the countrysuccessfully. At the same time, the current ruling party, which was in opposition at that time, pursued a consistent struggle to hold the election. ThePAFFREL also stood with the group that appeared for holding the elections. There are several issues that attract public attention in the question of holding an election at the moment:

1. Will the risk of Covid be increased by holdingthe elections?

2. Could the countryat this momentafford the cost of theelection (the cost incurred by the Election Commission)which will be around Rs. 6,000 - 10,000 million?

3. Will action be taken to reduce the number of Councilors which has been doubled by the new system, before the next election?

4. Do the people have faith in the people's representatives who are being appointed at great cost, and will there be any improvement in the living standards of the people by appointing them.

Though the above facts certainly draw the attention of informed citizens,at the moment, it appears that the election isbeing postponed mainly for political reasons. Several examples in this regard can be cited from the period during and before the previous Yahapalana regime.The manipulation of the electoral map of Sri Lanka by the incumbent ruler at his willis a deadly blow to representative democracy and an insult to the voter. It amounts to depriving the voter, the citizen of his rights to vote particularly this year, the 90th anniversary of universal suffrage. It is also an avoidance of a legitimate opportunity that the government has got to test the public opinion on the policies implemented by the government and change those policies if necessary.

Looking back at the past four decades, the frustrations and tensions created by the rolling of the electoral map and depriving the opportunity to test the sovereignty of the people ultimately ended up in a series of tragedies. We are still experiencing the adverse consequences of it. We believe that all parties who have held power are more or less responsible for this unfortunate situation.

We believe that the inalienable right of the citizens to democratically elect their representatives from time to time , and express their opinion , should be protected under whatever circumstances, and also would like to stress that if they are deprived of that opportunity, there is a great risk of it manifesting in different forms.

Rohana Hettiarachchie

Executive Director

PAFFREL